**RETIREMENT**

# AIA SMART PENSIONS



## ඔබේ විශ්‍රාම ජීවිතය තෘප්තිමත්ව ගත කරන්න

HEALTHIER, LONGER, BETTER LIVES

aialife.com.lk

විශ්‍රාමය පිළිබඳ අපගේ සිහින සහ බලාපොරොත්තු විවිධාකාරයි. අප කවුරුත් කැමති අද දින භුක්ති විඳින්නාවූ සුන්දර ජීවිතය ඒ ආකාරයෙන්ම අනාගතයේදීත් පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය ස්ථාවරත්වය ගොඩනගා ගැනීමටයි. ජීවිතයේ අත්දකින්නට සිදුවන අනපේක්ෂිත තත්ත්වයන් ඉදිරියේ දී කිසිවකුටත් බරක් නොවී ඒවාට මුහුණදීමටයි! මේ නිසාම තමයි අපට අද වගේම විශ්‍රාමයේදීත් මාසික ආදායමක් අතිශය වැදගත් වන්නේ.

හඳුන්වාදෙන AIA Smart Pensions ඔබගේ විශ්‍රාමය සඳහා ආදායමක් තහවුරු කරනවා. එපමණක් නොව ඉහළ යන ජීවන වියදම් මධ්‍යයේ පවා ඔබට සුපුරුදු ජීවන රටාව එලෙසින්ම පවත්වා ගැනීම සඳහා ඔබට අත්වැලක් වෙමින් ඒ ආදායම වසරක් පාසා වර්ධනය කරනවා.

## AIA Smart Pensions ඔබට පිරිනමන්නේ මොනවාද?

**ඔබේ විශ්‍රාම අරමුදල් ලෝයල්ටි දීමනා තුළින් තව දුරටත් ඉහළ නැංවේ**

වසරක් පාසා ඔබේ විශ්‍රාම අරමුදල නොකඩවා වර්ධනය වන අතර, වාරික ගෙවීමේ කාලසීමාව අවසානයේදී ඔබේ මූලික වාරිකය මෙන් 1750% ක් දක්වා වූ ලෝයල්ටි දීමනාවක් සමාගම විසින් ඔබේ අරමුදලට අමතරව එකතු කරනු ලැබේ (මෙම ප්‍රතිශතය ඔබ තෝරා ගත් වාරික ගෙවීමේ කාලසීමාව සහ වාරික ගෙවීමේ ආකාරය මත රඳා පවතී). මේ තුළින් ඔබේ විශ්‍රාම අරමුදල තවදුරටත් ඉහළ නංවන අතර මේ සඳහා ඔබ කළ යුත්තේ නියමිත කාලය තුළ, නිසි පරිදි වාරික ගෙවීම පමණි.

**AIA Pensions Booster (විශ්‍රාම වර්ධකය) විශේෂාංගය සමගින් ඉහළ මාසික විශ්‍රාම වැටුපක්**

AIA Pensions Booster (විශ්‍රාම වර්ධකය) යනු AIA Smart Pensions වෙතින් හඳුන්වාදෙන ලද අසමසම විශේෂාංගයකි. ඔබේ විශ්‍රාම ප්‍රතිලාභය ලෙස මාසිකව විශ්‍රාම ආදායමක් ලබා ගැනීම තෝරා ගතහොත් ඔබේ අරමුදලට බැර කිරීමට නියමිත වාර්ෂික ලාභාංශ ප්‍රතිශතය 30% කින් ඉහළ නංවා කිසිදු අමතර වියදමකින් තොරව ඔබේ විශ්‍රාමය සඳහා අමතර ආදායමක්ද ලබාදේ.

**හදිසි අවස්ථාවකදී අරමුදල් ආපසු ලබාගැනීමේ පහසුකම.**

සැලසුමේ තුන්වන වසරට පසුව, ඔබට විශ්‍රාම අරමුදලෙන් 15% ක් දක්වා මුදල් ආපසු ලබාගැනීමේ හැකියාව හිමි වන අතර මෙය වාරික ගෙවීමේ කාලසීමාව අතරවාරයේදී එක් වරක් පමණක් ලබාගත හැකි ප්‍රතිලාභයකි.

## ඔබ නොමැති කලකදී...?

**වාරික ගෙවීමේ කාලසීමාව අතරවාරයේදී ඔබ වියෝවුවහොත් ඔබේ ආදරණීයයන් හට මූල්‍ය සුරක්ෂිතභාවය තහවුරු කිරීමට එකවර මුදලක් හෝ මාසික ආදායමක්ද හිමිවේ.**

යම් අනපේක්ෂිත වියෝවීමකදී ඔබේ යැපෙන්නන් හට ජීවිත රක්ෂණ ප්‍රතිලාභයක් හිමිවේ. මෙය එකවර හෝ මාසික ආදායමක් ලෙස ලබා ගන්නවාද යන්න ඔබේ යැපෙන්නන්ගේ කැමැත්ත පරිදි තෝරාගත හැක. මෙපමණක් නොව AIA විසින් ඔබේ වාරික මුදල් ගෙවීම් කරමින් ඔබ නම් කරන ලද ප්‍රතිලාභීන්හට ඔබ සැලසුම් කරන ලද විශ්‍රාම දිනයේ සිට විශ්‍රාම අරමුදල එකවර හෝ මාසිකව ලබා දීමට කටයුතු කරයි.

ඔබ පූර්ණ හා ස්ථිර වශයෙන් ආබාධිත තත්ත්වයකට පත්වුවහොත්, AIA විසින් ඔබේ වාරික මුදල් ගෙවීම් කරමින් සැලසුමේ කාලසීමාව සම්පූර්ණකර ඔබට, ඔබ සැලසුම් කරන ලද විශ්‍රාම දිනයේ සිට විශ්‍රාම අරමුදල එකවර හෝ මාසිකව ලබා දීමට කටයුතු කරයි.

**විශ්‍රාම මුදල් ලබන්නාවූ කාලසීමාව අතරවාරයේදී ඔබ මිය ගියහොත් අවමංගල්‍ය වියදම් ප්‍රතිලාභයක්.**

අනපේක්ෂිත වියෝවීමකදී, ඔබගේ වාර්ෂික මූලික වාරිකය මෙන් 5 ගුණයක් හෝ රු. 500,000 ක උපරිමයක් දක්වා අවමංගල්‍ය වියදම් ආවරණය කර ගැනීම සඳහා ප්‍රතිලාභයක් නොමිලේම AIA විසින් පිරිනමනු ලැබේ.

## ඔබේ විශ්‍රාම අරමුදල වර්ධනය වන්නේ කෙසේද?

සෑම වසරකම ඔබේ විශ්‍රාම අරමුදලට වර්ධනයක් අත්කර දීමට අපගේ විශේෂඥ අරමුදල් කළමනාකරුවන් ක්‍රියා කරයි. උදාහරණයක් ලෙස, 2018 දී ඔබට වයස අවුරුදු 35 ක් නම්, වයස අවුරුදු 55 දී ඔබ විශ්‍රාම යාමට සැලසුම් කරයි නම් (වාරික ගෙවීමේ කාලය වසර 20 ක් වනු ඇත) රු. 100,000 ක වාර්ෂික මූලික වාරිකයක් ගෙවීම් කල විට වයස අවුරුදු 55 දී ඔබට හිමිවන විශ්‍රාම අරමුදල පහත පරිදි වනු ඇත.

| වාර්ෂිකව අපේක්ෂිත ලාභාංශ අනුපාතය | 4 % | 8% | 12% |
|---|---|---|---|
| විශ්‍රාමයේදී ඔබට හිමිවන විශ්‍රාම අරමුදල (රු.) | 3,651,276 | 4,948,069 | 7,054,940 |

විශ්‍රාමයේදී, ඔබගේ විශ්‍රාම අරමුදල විශාල ලෝයල්ටි දීමනාවකින් සමන්විත වේ. ඔබගේ ලෝයල්ටි දීමනාව වාරික ගෙවීමේ කාලසීමාව සහ ගෙවීම් කරනා ආකාරය මත රඳා පවතී. පහත නිදර්ශනයට අදාළවූ ලෝයල්ටි දීමනාව වාර්ෂික මූලික වාරිකය මෙන් 1225% ක් වන අතර එහි මූල්‍යමය වටිනාකම රු. 1,225,000 කි.

| වාරික ගෙවීම් කාලසීමාව | වාරික ගෙවීම් කරනා ආකාරය | | | |
|---|---|---|---|---|
| | වාර්ෂික | අර්ධ වාර්ෂික | ත්‍රෛ මාසික | මාසික |
| 15 - 19 | 825% | 700% | 650% | 625% |
| 20 - 24 | **1,225%** | 1,050% | 1,000% | 975% |
| 25 සිට ඉහළට | 1,750% | 1,500% | 1,450% | 1,425% |

මෙම අරමුදල, මාසිකව විශ්‍රාම මුදලක් ලෙස වසර 15 ක් සඳහා ලබාගැනීමට ඔබ තෝරාගතහොත් එය පහත නිදර්ශනය ලෙස වනු ඇත.

| වාර්ෂික නිදර්ශිත ලාභාංශ අනුපාතය | 4 % | 8% | 12% |
|---|---|---|---|
| වාර්ෂික නිදර්ශිත ලාභාංශ අනුපාතය පෙන්ෂන් බූස්ටර් සමගින් | 5.2% | 10.4% | 15.6% |
| වයස අවු. 56 | 20,285 | 27,489 | 39,194 |
| වයස අවු. 61 | 25,218 | 43,572 | 78,321 |
| වයස අවු. 66 | 31,351 | 69,064 | 156,506 |
| වයස අවු. 70 | 37,316 | 99,835 | 272,305 |
| කාලසීමාව තුළ ලැබෙන සම්පූර්ණ විශ්‍රාම ආදායම | **5,040,343** | **10,194,422** | **22,104,858** |

අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි

ඉහත ප්‍රක්ෂේපිත විශ්‍රාම අරමුදල් වටිනාකම් ගණනය කර ඇත්තේ අදාළ වාරික නියමිත දිනයන්හීදී ගෙවා ඇති බව, ලාභාංශ අනුපාතයන් 4%, 8% සහ 12% යටතේ අරමුදල වර්ධනය වන බව උපකල්පනය කරමින් සහ සැලසුමට අදාළ ගාස්තු අඩු කිරීමෙන් පසුවයි. තෝරාගන්නා වාරික ගෙවීම් මාදිලිය අනුව (එනම්, අර්ධ වාර්ෂික, ත්‍රෛමාසික හෝ මාසික යනාදී වශයෙන්) ඉහත නිරූපණ වටිනාකම් වෙනස් වනු ඇත.

මෙහි දක්වා ඇති ලාභාංශ අනුපාතයන් සහතික නොකෙරේ. එමෙන්ම මේ අනුපාතයන් ඔබට ලැබිය හැකි ඉහළම හෝ පහළම අනුපාතයන්ද නොවේ. ඉහත ප්‍රක්ෂේපිත විශ්‍රාම ප්‍රතිලාභයට අමතරව, ඔබගේ රැකවරණ ප්‍රතිලාභ පහත දැක්වේ.

| ඇතුලත්ව තිබෙන ප්‍රතිලාභ | අගය (රු.) |
|---|---|
| මරණයකදී ගෙවන මුදල (මූලික රක්ෂිත මුදල + අතිරේක ජීවිතාවරණ ප්‍රතිලාභය) | 3,000,000 |
| වාරික ආරක්ෂණ ප්‍රතිලාභය | මරණයකදී හෝ පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී ඉදිරි වාරික තැන්පත් කිරීමේ වගකීමෙන් නිදහස් වේ. එහෙත් ඔබේ සැලසුම ඒ ආකාරයෙන්ම ඉදිරියට පවත්වාගෙන යමින් විශ්‍රාම අරමුදල හෝ මාසික විශ්‍රාම මුදල ඔබට ලබා දීමට කටයුතු කෙරේ. |

මූලික රක්ෂිත මුදලට අදාළ ආවරණය ලබාදීමට සහ ඔබේ අරමුදල ගොඩනැගීමට වාර්ෂික මූලික වාරිකය වන රු.100,000 යොදා ගැනෙනු ඇත. "අතිරේක ජීවිතාවරණ ප්‍රතිලාභය" සහ "වාරික ආරක්ෂණ ප්‍රතිලාභය" ද ඇතුළුව මුළු වාර්ෂික වාරිකය ශ්‍රී ලංකා රුපියල් 118,636 ක් වේ.

## AIA Smart Pensions සැලසුම සම්බන්ධ වෙනත් තොරතුරු

ඇතුලත් වීමේ වයස: අවුරුදු 19 - 61 (ඊළඟ උපන්දිනයට)

උපරිම විශ්‍රාම යාමේ වයස: අවුරුදු 76 (ඊළඟ උපන්දිනයට)

වාරික ගෙවීමේ කාලසීමාව: අවුරුදු 15 - 30

අවම අමතර ජීවිතාවරණ ප්‍රතිලාභය: රුපියල් 750,000ක් හෝ වාර්ෂික මූලික වාරිකය මෙන් 14 ගුණයක් යන අගයන්ගෙන් ඉහළ අගය.

### අදාළ ගාස්තු

### වෙන්කිරීමේදී අයකිරීම්

| සැලසුම් වසර | 1වන සැලසුම් වසර | 2වන සැලසුම් වසර | 3වන සැලසුම් වසර | 4වන සැලසුම් වසරේ සිට |
|---|---|---|---|---|
| මූලික වාරිකය සඳහා වන වෙන්කිරීමේ ගාස්තු | 85% | 50% | 25% | 1.5% |
| Top-Ups සඳහා වෙන්කිරීමේ ගාස්තු | 4% (සෑම Top-Ups වාරිකයක් මත) | | | |

### පවාරණ ගාස්තු

| සැලසුම් වසර | 1වන සැලසුම් වසර | 2වන සැලසුම් වසර | 3වන සැලසුම් වසර | 4වන සැලසුම් වසරේ සිට |
|---|---|---|---|---|
| පවාරණ ගාස්තුව | 100% | | | 100% සිට 0%* |

*වාරික ගෙවීමේ කාලසීමාව පුරා පහත වැටේ

**පරිපාලන ගාස්තුව:**
2018 සඳහා වසරකට රු. 300 ක් වන අතර එක් එක් වසරෙහි ජනවාරි 1 වැනි දින වසරකට 15% බැගින් ඉහළ යයි.

**අරමුදල් කළමනාකරණ ගාස්තුව:**
ආයෝජන ගිණුමේ ශේෂයෙන් වාර්ෂිකව 0.75%

**මර්තයතා ගාස්තුව:**
සමාගම විසින් මූලික රක්ෂිත මුදල ලබාදීම සඳහා වන වියදමට අදාළ අයකිරීම් මත පදනම් වේ.

**මාදිලි ගාස්තුව:**
මාසික වාරික මාදිලිය, මූලික වාරිකයෙන් 4% කි.

# අමතර ප්‍රතිලාභ

## හදිසි අනතුරු ප්‍රතිලාභය

හදිසි අනතුරකින් සිදුවන වියෝවකදී ඔබේ යැපෙන්නන්ට මෙයින් වැඩි රැකවරණයක් හිමි වේ. එයට අමතරව ඔබට හදිසි අනතුරක් හේතුවෙන් නිත්‍ය අකර්මණ්‍යතාවයකට මුහුණ දීමට සිදුවුවහොත් මූල්‍යමය රැකවරණය මෙයින් සැලසෙනු ඇත. (සැලසෙන මූල්‍ය ප්‍රතිලාභයේ වටිනාකම අකර්මණ්‍යතාවයේ ස්වභාවය මත රඳා පවතී)

## රෝහල් ගාස්තු ආවරණය

ඔබ සහ ඔබේ පවුලේ සාමාජිකයන් වෙත ශ්‍රී ලංකාව තුළ වැය වන වෛද්‍යමය වියදම් නැවත පියවාගත හැකි සෞඛ්‍ය රක්ෂණ ආවරණයකි. (මෙම ප්‍රතිලාභය වාරික ආරක්ෂණ ප්‍රතිලාභය මගින් ආවරණය නොවේ)

## පවුල් රෝහල් ගාස්තු ආවරණය

ඔබ සහ ඔබේ පවුලේ සැමට ශ්‍රී ලංකාව තුළ වැය වන සෞඛ්‍ය වියදම් නැවත පියවාගත හැකි පූර්ණ රෝහල් ගාස්තු ආවරණයක්. (මෙම ප්‍රතිලාභය වාරික ආරක්ෂණ ප්‍රතිලාභය මගින් ආවරණය නොවේ)

## රෝහල් ගතවීමේ ප්‍රතිලාභය

ඔබ දින තුනකට වඩා රෝහල්ගතව සිටියේනම්, සෑම දිනකටම (ඇතුළත් කළ දිනයේ සිට) රු.10,000 ක උපරිමයක් දක්වා මුදල් ලබා දෙයි. දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කළහොත් ලැබෙන එම මුදල දෙගුණ වේ. මෙම ප්‍රතිලාභය ඔබේ කලත්‍රයා හා දරුවන් වෙනුවෙන්ද ලබාගත හැක.

## බරපතල රෝග ආවරණය

බරපතල රෝගාබාධ 22 කදී ඔබට හා ඔබගේ කලත්‍රයාට මූල්‍ය ආධාර ලබාදෙයි. රුපියල් මිලියන 3 ක උපරිමයක් දක්වා වූ ආවරණයක් ඔබට තෝරාගත හැකියි.

## වැඩිහිටි සැත්කම් ප්‍රතිලාභය

ඔබ හා ඔබේ කලත්‍රයා වෙත ශ්‍රී ලංකාවේදී, ඉන්දියාවේදී, සිංගප්පූරුවේදී, තායිලන්තයේදී හෝ මැලේසියාවේ ලැයිස්තුගත සැත්කම් 250 ක් සිදු කිරීම සඳහා මෙමගින් මූල්‍ය සහය හිමිවේ.

## කලත්‍ර ජීවිත ආවරණය

මෙම සැලසුම තුළින් ඔබේ කලත්‍රයාටද ජීවිත රැකවරණයක් සැපයේ.

## ළමා සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභය

ඔබේ දරුවාට ශ්‍රී ලංකාවේදී, ඉන්දියාවේදී, සිංගප්පූරුවේදී, මැලේසියාවේ හෝ තායිලන්තයේදී ලැයිස්තුගත සැත්කම් 250 ක් සිදුකිරීම සඳහා මෙමගින් මූල්‍ය සහය හිමි වේ. එයට අමතරව මෙමගින් රෝහල් ගතවීම සඳහා මුදල්ද වයස අවුරුදු 12 ට අඩු දරුවෙකු සමග මවුපියන්ගෙන් අයෙකුට රෝහලේ නැවතීමට සිදු වුවහොත් ඒ සඳහා විශේෂ දීමනාවක්ද පිරිනැමේ.

## නියමයන් සහ කොන්දේසි

රක්ෂිතයා රක්ෂණවර හිමියා නොවන අවස්ථාවකදී, මෙම රක්ෂණ සැලසුමේ ප්‍රතිලාභ රක්ෂණවර හිමියාට අදාළ වන අතර ආවරණයන් රක්ෂිතයා සඳහා අදාළ වේ. මෙම සැලසුම ලබාගත හැක්කේ බලයලත් AIA වත්කම් සැලසුම්කරුවෙකු මගින් හෝ බෑන්ක් ඇෂුවරන්ස් විධායකවරයෙකු හරහා පමණි.

මෙම පත්‍රිකාව රක්ෂණ වරය පිළිබඳ සංක්ෂිප්තයකි. මෙම සැලසුම සම්බන්ධ සම්පූර්ණ විස්තර සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව බලන්න.

SP - 300000352
V2 - 05/18

# AIA සමූහය පිළිබඳ

AIA සමූහය ආසියා ශාන්තිකර කලාපයෙහි විශිෂ්ටතම ජීවිත රක්ෂණ සේවා සම්පාදකයා වේ.



1919
චීනය

1931
හොංකොං

1931
සිංගප්පූරුව

1938
තායිලන්තය

1947
පිලිපීනය

1948
මැලේසියාව

1957
බෘනායි

1972
ඕස්ට්‍රේලියාව

1981
නවසීලන්තය

1982
මැකාවු

1984
ඉන්දුනීසියාව

1987
කොරියාව

1990
තායිවානය

2000
වියට්නාමය

2001
ඉන්දියාව

2012
ශ්‍රී ලංකාව

2013
මියන්මාරය *

2015
කාම්බෝජය

* මියන්මාරයේ ඇත්තේ AIA නියෝජිත කාර්යාලයකි.

**US$ ට්‍රිලියන 1 කට** වැඩි සමස්ත මූලික රක්ෂිත මුදලක්

ආසියාවේ **වසර 100 කට ආසන්න** සාඩම්බර ඉතිහාසයක්

**වෙළඳපළ 18 ක මෙහෙයුම්**

**මිලියන 30 කට** අධික තනි පුද්ගල රක්ෂණවර

**මිලියන 16 කට** අධික සමූහ සැලසුම් සාමාජිකයින්

HEALTHIER, LONGER, BETTER LIVES

**AIA ඉන්ෂුවරන්ස් ලංකා PLC**
(Co.No.PQ 18)
AIA ටවර්, 92, ධර්මපාල මාවත, කොළඹ 07
ක්ෂණික ඇමතුම්: 011 2310310
ෆැක්ස්: 011 4715892
ඊ-මේල්: lk.info@aia.com

AIA Insurance Lanka PLC (Co.No.PQ 18) විසින් නිකුත් කරන ලද. 05/2018